# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1703/18 - 2011 අප්‍රේල් 28 වැනි බ්‍රහස්පතින්දා - 2011.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

පළාත් පාලන නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගනිත්යේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (අ) වන කොටසේ 2010 ජූලි මස 16 දිනැති හා අංක 1663 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කරනු ලැබූ වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු, සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමින් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, වයඹ පළාතේ, පළාත් සභාව විසින් 2011 ජනවාරි මස 18 වැනි දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජී. දයානන්ද,
වයඹ පළාතේ පළාත් සභාවේ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.

2011 අප්‍රේල් මස 21 වැනි දින.
කුරුණෑගල දී ය.

05-250


1A - PG 001236 — 335 (2011/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.